රහසිගතයි

# අමාත්‍ය මණ්ඩල කාර්යාලය
# அமைச்சரவை அலுவலகம்
# OFFICE OF THE CABINET OF MINISTERS

CABINET DECISION    අමාත්‍ය මණ්ඩල තීරණය    அமைச்சரவைத் தீர்மானம்

27 OCT 2017

පිටපත් : ජනාධිපති ලේකම්.
අග්‍රාමාත්‍ය ලේකම්.
ජාතික ප්‍රතිපත්ති හා
ආර්.ක.ලේකම්.
මුදල් හා ජනමාධ්‍ය ලේකම්.
සභාපති, ශ්‍රී ලංකා මහජන
උපයෝගිතා කොමිෂන් සභාව.
විගණකාධිපති.

මගේ අංකය: අමප/17/2308/727/048
2017 ඔක්තෝබර් මස 25 දින.

ක්‍රියා කළ යුතු : විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශයේ ලේකම්.

**සූර්යබල සංග්‍රාමය යටතේ විචල්‍ය මිල විකල්ප මූලධර්මය යටතේ තරගකාරී ටෙන්ඩර් ක්‍රමය මඟින් <u>කුඩා පරිමාණ සූර්ය විදුලි බලාගාර පිහිටුවීම - අදියර II</u>**

(විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති ගරු ඇමතිතුමා ඉදිරිපත් කළ 2017-09-22 දිනැති සංදේශය)

2017 ඔක්තෝබර් මස 17 දින පැවැත්වුණු අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී එළඹි තීරණයක් අවශ්‍ය කටයුතු සඳහා මේ සමඟ එවා ඇත.

ඩබ්ලිව්.එම්.ඩී.ජේ.ප්‍රනාන්දු
අතිරේක ලේකම්.

අ.කලේ/එස්.අබේසිංහ
අමාත්‍ය මණ්ඩලයේ ලේකම්

(ආ) න්‍යාය පත්‍රයේ විෂයයන්:

(I) අමාත්‍ය මණ්ඩල පත්‍රිකා - සාමාන්‍ය:

21. අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 17/2308/727/048 වූ, "සූර්යබල සංග්‍රාමය යටතේ විචල්‍ය මිල විකල්ප මූලධර්මය යටතේ තරගකාරී ටෙන්ඩර් ක්‍රමය මඟින් කුඩා පරිමාණ සූර්ය විදුලි බලාගාර පිහිටුවීම - අදියර II" යන මැයෙන් විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති ඇමතිතුමා ඉදිරිපත් කළ 2017-09-22 දිනැති සංදේශය - (අමප අංක 16/2511/727/050/ටීබීආර් පිළිබඳව වූ 2016-12-06 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයට අදාළව) ඉහත සඳහන් සංදේශය වැඩබලන මුදල් හා ජනමාධ්‍ය ඇමතිතුමාගේ නිරීක්ෂණ සමඟ සලකා බලන ලදී. මේ පිළිබඳව සාකච්ඡා කිරීමෙන් අනතුරුව, පහත සඳහන් පරිදි අනුමැතිය ලබා දීමට තීරණය කරන ලදී:

→ 2

(i) සංදේශයේ 3 ඡේදයෙහි සඳහන් (1) සහ (2) යෝජනා සඳහා; සහ

(ii) වැඩබලන මුදල් හා ජනමාධ්‍ය ඇමතිතුමාගේ නිරීක්ෂණවල (ආ) ඡේදයෙහි නියම කොට දක්වා ඇති කොන්දේසියට අනුගතව ලංකා විදුලිබල මණ්ඩලය විසින් පියවර ගනු ලැබීමට යටත්ව, සංදේශයේ සඳහන් (3) යෝජනාව සඳහා.

ක්‍රියා කළ යුතු: විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය - ඉහත නිරීක්ෂණ යා කොට ඇත.

පිටපත්: ජනාධිපති ලේකම් - සංදේශයේ පිටපතක් හා ඉහත නිරීක්ෂණ යා කොට ඇත.
අග්‍රාමාත්‍ය ලේකම් - සංදේශයේ පිටපතක් හා ඉහත නිරීක්ෂණ යා කොට ඇත.
ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය - සංදේශයේ පිටපතක් හා ඉහත නිරීක්ෂණ යා කොට ඇත.
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
සභාපති, ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව - සංදේශයේ පිටපතක් හා ඉහත නිරීක්ෂණ යා කොට ඇත.